Disability Inclusion
Education for All

# ගැලපීම් මට්ටම්

පහසුකම් සලසන්නා විසින් රැස්වීමේදී ශිෂ්‍යයෙකුගේ සහභාගීත්වය සහ ඉගෙනීම සක්‍රීය කිරීම සඳහා අවශ්‍ය ගැලපුම් මට්ටමට එකඟ වනු ඇත. එහිදී පැතිකඩ සම්පූර්ණ කිරීම සඳහා SSG සාමාජිකයින්ට එක්ව කටයුතු කිරීමට පහසුකම් සපයන්නා සහාය වනු ඇත.

| ගැලපුම් මට්ටම පිළිබඳ විස්තරය | මෙයින් අදහස් වන්නේ කුමක්ද? |
|---|---|
| සමස්ත පාසල් මට්ටමින් පිරිනමනු ලබන **වර්තමාන ආධාරක පරිසරය** තුළ, සම වයසේ මිතුරන්ට ලබා දෙන අධ්‍යාපන වැඩසටහනට සිසුන් ප්‍රවේශ වනු ඇත. | මෙයින් අදහස් වන්නේ **ගැලපීම් අවශ්‍ය නොවන** බවය. |
| **වෙනස් ඉගැන්වීම** යනු තම සම වයසේ මිතුරන් මෙන් ඉගෙනීමට ප්‍රවේශ වීමට පුළුල් ශිෂ්‍ය කණ්ඩායමකට සහාය වන පන්ති මට්ටමින් සිදුවන ගැලපීම් ය. | මෙමගින් අදහස් වන්නේ **සුපුරුදු පන්ති කාමර පුහුණුව හරහා ගැලපීම් සපයනු ලබන බවයි.** |
| **සතිය තුළ නිශ්චිත වේලාවන්හිදී සමහර ක්‍රියාකාරකම් සඳහා** අතිරේක ගැලපීම් සිදු වේ. පාසල විසින් ශිෂ්‍යයාට යම් තනි උපාය මාර්ග ලබා දෙයි. | මෙයින් අදහස් වන්නේ **සමහර අවස්ථාවල දී පමණක් ගැලපීම් සැපයෙන බවයි.** |
| **සැලකිය යුතු ගැලපීම්** යනු බොහෝ දිනවල බොහෝ අවස්ථාවල දී ශිෂ්‍යයා සඳහා වන සුපුරුදු අධ්‍යාපන වැඩසටහනට සිදුවන ආධාරක හෝ ගැලපීම් වේ. | මෙමගින් අදහස් වන්නේ බොහෝ අවස්ථාවල දී **ගැලපීම් සැපයෙන බවයි.** |
| **ව්‍යාප්ත ගැලපීම්** යනු ශිෂ්‍යයා සඳහා සෑම විටම කෙරෙන පුද්ගලාරෝපිත සහ ඉලක්කගත ගැලපීම් සහ/හෝ දැඩි සහාය වේ. | මෙමගින් අදහස් වන්නේ සියලු අවස්ථාවන් හි දී **ගැලපීම් සැපයෙන බවයි.** |

Sinhalese | සිංහල

22-030

VICTORIA State Government | Department of Education